10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

## අර්ථ ක්‍රමයක ක්‍රියාවලිය.



අන්තර්ගතය - A.M.R.N.S අමරතුංග- ගුරු උපදේශක - රත්නපුර අධ්‍යාපන කලාපය
සැකසුම - N.H.M.සායිබු- මප/නු/ශා.ගේබ්‍රියල් බාලිකා මහා විද්‍යාලය , හැටන්.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

මිනිසා නිෂ්පාදන ක්‍රියාවලියේ දී මතුවන ආර්ථික ප්‍රශ්න සඳහා විසඳුම් සොයා ගන්නා ආකාරය මත නැතහොත් ආර්ථික ප්‍රශ්න වලට මුහුණ දෙන ආකාරය මත ලෝකයේ අර්ථ ක්‍රම කීපයක් හඳුනාගෙන ඇත.එම සෑම අර්ථ ක්‍රමයක්ම ආර්ථික ක්‍රියාවලි ගණනාවක් සිදු කරනු ලබයි.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# අර්ථ ක්‍රමය

## නිෂ්පාදනය

- කාර්මික



- කෘෂිකාර්මික



- සේවා




## පරිභෝජනය

නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා යොදා ගෙන මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම පරිභෝජනය වේ.

භාණ්ඩ ගෙන්වා පරිභෝජනය කරන්නා පාරිභෝගිකයා වේ.

පරිභෝජනය කරන භාණ්ඩ පාරිභෝගික භාණ්ඩ වේ.

## බෙදාහැරීම

නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා දක්වා යොමු කිරීමේ ක්‍රියාවලිය බෙදාහැරීම වේ.

වෙළඳපොළ මගින් මුදල් මාධ්‍යකර ගනිමින් බෙදාහැරීම සිදුවේ.

වෙළඳාම

- තොග වෙළඳාම
- සිල්ලර වෙළඳාම


Copyright © e-thaksalawa.moe.gov.lk

- ආර්ථික ක්‍රියාවලි අතර නිෂ්පාදන ක්‍රියාවලියේ දී, නිෂ්පාදකයා බොහෝ අවස්ථා වල පාරිභෝගිකයාගේ උවමනාවන් ඉටුවන භාණ්ඩ නිපදවීමට පෙළඹේ.

## නිෂ්පාදන භාණ්ඩ

### ආර්ථික භාණ්ඩ

නිෂ්පාදනයේ පිරිවැයක් දැරීමට සිදුවන පරිහරණයේ දී මිලක් ගෙවීමට සිදුවන භාණ්ඩ.







### ආර්ථික නොවන භාණ්ඩ

ස්වභාව ධර්මයෙන් නොමිලේ ලැබේ.



හිරු එළිය



ජලය

ආර්ථික නොවන භාණ්ඩ ආර්ථික භාණ්ඩ වන අවස්ථාද ඇත.

උදා :- බෝතල් කළ ජලය, නයිට්‍රජන් වායුව



Copyright © e-thaksalawa.moe.gov.lk

නිෂ්පාදන ක්‍රියාවලියේ දී දායක කර ගන්නාවූ සාධක **නිෂ්පාදන සාධක** ලෙස හඳුන්වයි.

## නිෂ්පාදන සාධන

### භූමිය

- අප ජීවත් වන්නා වූ මහ පොළව හා සම්බන්ධ සියළු සම්පත් භූමියට අයත් වේ. උදා :- ගස් වැල්, ඇළ දොළ
- ලැබෙන ප්‍රතිලාභය **බිම් කුලිය** වේ.

### ශ්‍රමය

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී පුද්ගලයන් වැය කරනු ලබන කායික හා මානසික වෙහෙස ශ්‍රමය යි. උදා :- කම්කරුවකු කායික ශ්‍රමයද, වෛද්‍යවරයකු මානසික ශ්‍රමයද යොදවයි.
- ලැබෙන ප්‍රතිලාභය **වැටුප්** වේ.

### ප්‍රාග්ධනය

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මිනිසා විසින් යොදවනු ලබන විවිධ මෙවලම්ය. උදා :- මුදල්, යන්ත්‍රසූත්‍ර, ගොඩනැගිලි
- ලැබෙන ප්‍රතිලාභය **පොලිය** වේ.

### ව්‍යවසායකත්වය

- නිශ්පාදන සාධක ඒකරාශි කර නිෂ්පාදක ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ව්‍යවසායකයා ය.
- ලැබෙන ප්‍රතිලාභය **ලාභය** වේ.



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ඉහත ආකාරයට ආර්ථිකයක කටයුතු තීරණය වීමේ දී මූලික ආර්ථික ප්‍රශ්න විසුම් සොයා ගන්නා ආකාරය මත අර්ථ ක්‍රම 03ක් හඳුනාගෙන ඇත.

# අර්ථ ක්‍රමය

## ධනවාදී අර්ථක්‍රමය

- තරඟකාරී වෙළඳපොළ.
- නිෂ්පාදන සාධක පෞද්ගලික අංශයට.
- ලාභය අරමුණු කර ගනී.
- ආදායම් විෂමතාවය ඇත.

උදා :- ඇ.එ.ජනපදය
බ්‍රිතාන්‍යය
ජපානය
ඕස්ට්‍රේලියාව

## සමාජවාදී අර්ථක්‍රමය

- මධ්‍ය සැලසුම් මණ්ඩලයක් ඇත.
- දේපළ අයිතිය රජය සතු වීම.
- සුබසාධනය නිෂ්පාදනයේ අරමුණ වේ.

උදා :- කැනඩාව
උ.කොරියාව

## මිශ්‍ර අර්ථක්‍රමය

- නිෂ්පාදනතාව රජය හා පෞද්ගලික අංශය සතුය.
- වෙළඳපොළ මත මිළ තීරණය වේ.
- මිල තීරණය වීමේදී රජය මැදිහත් වේ.

උදා :- ශ්‍රී ලංකාව


Copyright © e-thaksalawa.moe.gov.lk

## ක්‍රියාකාරකම

පහත වගුව සම්පූර්ණ කරන්න.

| ධනවාදී අර්ථක්‍රමය | | සමාජවාදී අර්ථක්‍රමය | | මිශ්‍ර අර්ථක්‍රමය | |
|---|---|---|---|---|---|
| වාසි | අවාසි | වාසි | අවාසි | වාසි | අවාසි |
| | | | | | |


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk